# ප්‍රසම්පාදන දැන්වීම

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

පහත සඳහන් වැඩ විෂයන් සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වැඩ විෂය | ලියාපදිංචි ශ්‍රේණිය/ ක්ෂේත්‍රය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු.) | ආපසු ගෙවන ලංසු බැඳුම්කර (රු.) | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු ගත වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|
| 01 | මෝරගල හොරගොඩ පාර අසල පාලම ඉදිකිරීම | C 7 සහ ඉහල ගොඩනැගිලි | 5,000.00 | 121,000.00 | 12,092,371.79 |
| 02 | බේරුවාන කසළ කළමණාකරන අංගනය පුළුල් කිරීම | C 7 සහ ඉහල ගොඩනැගිලි | 3,500.00 | 91,000.00 | 9,039,000.00 |
| 03 | කිතගහවිල ආයුර්වේදයේ අත්‍යවශ්‍ය කොටස් වැඩි දියුණු කිරීම | C 7 සහ ඉහල ගොඩනැගිලි | 3,000.00 | 41,000.00 | 4,500,000.00 |
| 04 | සදර්ලැන්ඩ් වත්ත අශෝක රංජන් මහතාගේ නිවස අසල සිට දුෂ්කර කොටස් සංවර්ධනය කිරීම | C 8 සහ ඉහල ගොඩනැගිලි | 3,000.00 | 31,000.00 | 3,000,000.00 |

02. මෙම ලංසු කැඳවීම ජාතික තරගකාරී ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර, මෙම කර්මාන්තයන්ට අදාල CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමු පළාත් ඉදිකිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචි පදනම් කර ගනිමින් ලංසුකරුවන් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

03. ඉහත වැඩ විෂයට අදල ලංසුපත් 2026.07.09 වන දින සිට 2026.07.23 දක්වා සතියේ වැඩ කරන දින වල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට මුදලින් ගෙවා ලබා ගත යුතුය.

04. සියලුම ලංසුකරුවන් එක් එක් ඉදිකිරීම් සඳහා එම කර්මාන්තය ඉදිරියෙන් සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් .2026.07.24 දින සිට 2026.10.08 දක්වා වලංගු වන පරිදි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් නියෝග කළ වහාම කොන්දේසි විරහිතව මුදල් බවට පත් කරවා ගත හැකි (Unconditional On Demand Bank Guarantee) බැංකු ඇපකරයක් සභාපති , ප්‍රාදේශීය සභාව, ඇහැලියගොඩ නමින් හෝ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මුදල් තැම්පත් කර ලබා ගත් කුවිතාන්සි වල මුල් පිටපත් සෙසු ලංසු ලේඛණවල මුල් පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය. සියළුම ලංසු 2026.09.10. දින දක්වා වලංගු විය යුතුය.

05 ඉහත ඉදිකිරීම් පිළිබඳ විස්තර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ කාර්යාල වේලාවන් තුළදී දැන ගත හැකිය (0362258012/14)

06. සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කරනු ඇත. ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසු පිටපත් දෙකකින් යුතුව 2026.07.24 දින පෙ.ව 10.00 දක්වා ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ තබා ඇති මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමෙන් හෝ ප්‍රසම්පාදන කමිටු සභාපති, ප්‍රාදේශීය සභාව, ඇහැලියගොඩ නමට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් ඉදිරිපත් කළ හැකිය.මුල් ලංසු පත හා පිටපත ලෙස නම් කර ඉහළ වම් කෙලවරේ කර්මාන්තයේ නම සඳහන් කර කවරවල බහා වෙන් වෙන්ව මුද්‍රා කර නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

08. 2026.07.24 දින පෙ.ව. 10.00 ට ලංසු භාර ගෙන අවසන් වූ වහාම පෙ.ව.10.00.ට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ දී ලංසු කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.

**බන්ධුලසේන දුණුවිල,**
**ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,**
**2026.07.09**